# MINISTRY OF EDUCATION

## අධ්‍යාපන අමාත්‍යාංශය

## G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

## අ.පො.ස. සාමාන්‍ය පෙළ - ආදර්ශ ප්‍රශ්න පත්‍ර

## GEOGRAPHY

## භූගෝල විද්‍යාව

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව
The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

## භූගෝල විද්‍යාව - I

## අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

සැළකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 යි.

**1 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1' පෘථිවියේ වායු සංයුතිය අනුව වායුගෝලයේ උණුසුම රඳවා ගැනීමට වඩාත් වැදගත්වන වායු වර්ගය වන්-න්................................
^ ඔක්සිජන් / කාබන්ඩයොක්සයිඩ් /නයිට්‍රජන් )

2' සාගරික කබොල ප්‍රධාන වශයෙන් ....................................... පාෂාණ වලින් නිර්මාණය වි ඇත
^නයිස් / ග්‍රැනයිට් / බැසොල්ට් )

3' මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම් වලින් සහ ඉහළ උන්නතාංශයකින් යුත් විහිදෙන භූ රූප................................
^කඳු පද්ධතිය /කඳු යාය / කඳු වැටිය )

4' පෘථිවි තලයේ සිට කිලෝමීටර 6ක් පමණ දක්වා කලාපය තුළ, වායු ගෝලයේ මුළු වායු පරිමාවෙන් .................................. ක්
පමණ අන්තර්ගත වේ (25% /50% / 60%)

5' """"""""""""""""""""""".;ඔය පදනම් කරගෙන ඉදිකරන ලද ජලාශයකි. ( ඉඟිනියාගල / ඉඟිනිමිටිය /බෝවතැන්න )

6' පෘථිවි පෘෂ්ඨයේ රැස් වූ ශක්තිය එහි රැඳවුම් ධාරිතාව ඉක්මවූ කල ................................ මඟින් එය මුදා හරිනු ලබයි
^ සංවහන ධාරාවක් / තල ගැටීමක් / භූමි කම්පාවක්)

7' ලෝකයේ ඇති අධිජන සංකේන්ද්‍රණ බහුලවම................................ ප්‍රදේශවල ව්‍යාප්ත වී තිබීම විශේෂ ලක්ෂණයකි
^ආසියාතික / නිවර්තන / වෙරළබඩ)

8' රටකට අයත් මුහුදු සීමාව තිරණය කරන අන්තර්ජාතික සාගර නිතිය ................................ දින සිට ලෝකය පුරා ක්‍රියාත්මක වේ
^ 1984 නොවැම්බර් 16 / 1994 නොවැම්බර් 16 / 1998 දෙසැම්බර් 16 )

9' ඉතා ඉහළ උපත් අනුපාතයක් සහ පහළ මරණ අනුපාතයක් පැවතිමෙන් කෙටි කාලයක් තුළ ජන සංඛ්‍යා................................
සිදුවිය හැක ( ස්ඵෝටනයක් / වර්ධනයක් / ව්‍යාප්තවීමක් )

10' ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ජනතාව පරිභෝජනය සඳහා ජලය සපයා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය ................................ වේ
^ අහස් දිය / ගංගා ජලය / භූගත ජලය )

**11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11' මෙට්‍රික් සිතියම්වල දිශා සටහනේ අර්ධ ඊ හිසකින් නිරූපණය වන්නේ ජාල උතුරයි ( නි/වැ)

12' ඉන්දු - ශ්‍රී ලංකා දේශසීමාවට අයත් මන්නාරම් මුහුදු කලාපය පෝක් සමුද්‍ර සන්ධිය හා බෙන්ගාල බොක්ක යන කලාපයේ මුහුදු සීමාව ඓතිහාසික ජල ප්‍රදේශය ලෙස හැඳින්වේ ( නි/වැ)

13' 2012 වර්ෂයට අනුව ශ්‍රී ලංකාවේ කාර්මික අපනයනයන්හි විදේශ විනිමය ඉපයීම 23% ලෙස වාර්තා විය ( නි/වැ)

14' ,වණිකරණයට ප්‍රධාන හේතුවක් වන්නේ වැඩි වශයෙන් වාරි ජලය ගොඩබිම්වලට යොදා ගැනීමයි ( නි/වැ)

15' බෝග වගාවේදි ජාන තාක්ෂණය භාවිතය තුළින් පරිසර හිතකාමී ලෙස කෘෂි කාර්මික නිෂ්පාදන කටයුතු සිදු කර .; හැක ( නි/වැ)

**16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල ''අ''සහ ''ආ'' යනුවෙන් තීර දෙකක් දක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

**16'** මෙට්‍රික් සිතියම්වල පර්යන්ත තොරතුරු පිළිබඳ දි ඇති තොරතුරු ගලපන්න

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1 – සිතියම් වර්ගය | A. මුහුණත |
| 2 - ජාත්‍යන්තර ඛණ්ඩාංක අගය | B. ඇතුළු මායිම් තීරුව |
| 3 - පරිමාණය | C. ඉහළ වට තීරුව |
| | D. පහළ වට තීරුව |

BCD (2) DAB (3) CBD (4) ACB (..........)

**17'** ශ්‍රී ලංකාවේ විදුලිබලාගාර කිහිපයක් ''අ'' තීරුවේ ඇත. එම විදුලි බලාගාර පිහිටුවීමට මුල් වූ ගංගා කිහිපයක් ''ආ'' ී;රයේ ද දක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1 - සමනල වැව | A. මහවැලි ගඟ |
| 2 - කැනියන් | B. මාදුරු ඔය |
| 3 - රංටැඹේ | C. කැළණි ගඟ |
| | D. වළවේ ගඟ |

(1) CBA (2) DAC (3) DCB (4) DCA (..........)

**18.** ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රභේද කිහිපයක් ''අ'' තීරුවේ ද, ඒවායේ බහුලව දැකිය හැකි ශාක වර්ග ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1' කඳුකර තෙත් වනාන්තර | A - කිරළ, ගොඩපර |
| 2' කඳුරට වියළි කලාපීය වනාන්තර | B - සපු , කීන |
| 3' කටුපඳුරු හා ළඳු කැලෑ | C - අරළු , මහරත් මල් |
| | D - පලු , වීර |

(1) BCD (2) CBA (3) BDC (4) CBD (..........)

**19.** ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන පාංශු කලාප කිහිපයක් ''අ'' තීරුවේ ද, ඒවා ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1' සොලිඩෙක්ස් පස | A - දමන හා තමන්කඩුව |
| 2' රතු කහ ලැටසෝල් පස | B - පහතරට තෙත් කලාපීය දිස්ත්‍රික්ක |
| 3' චූර්ණමය නොවූ දුඹුරු පස | C - පුත්තලම සිට මුලතිව් දක්වා වෙරළබඩ ප්‍රදේශ |
| | D - අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්ක |

(1) DCA (2) ACD (3) CAB (4) BCD (..........)

**20.** ලෝකයේ මහාද්වීප කිහිපයක නම් ''අ'' තීරුවේ ද, ගංගා කිහිපයක් ''ආ'' තීරුවේ ද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1' ආසියාව | A - කොංගෝ |
| 2' උතුරු ඇමරිකාව | B - වොල්ගා |
| 3' අප්‍රිකාව | C - ලීනා |
| | D - මැකැන්සි |

(1) ADC (2) ADB (3) CAD (4) CDA (..........)

**21 සිට 26 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21' මරියානා හා මින්ඩනාඕ යන අගාධ පිහිටා ඇත්තේ ........................................................ සාගරයේය

22' ශ්‍රී ලංකාවට බලපාන නිවර්තන වාසුළි ........................................... ආශ්‍රිත සාගරික ප්‍රදේශය ඇසුරු කරගෙන උපත ලබයි .

23' 2012 වර්ෂයේ රටවල් 187 ක මානුෂ සංවර්ධක දර්ශක අගය අතරින් ශ්‍රී ලංකාව ...................................... වන ස්ථානය හිමිකරගෙන ඇත.


24' දකුණු අක්ෂාංශ 23 1/2$^0$ .............................. නිවර්තනය ලෙස හඳුන්වයි

25' නිශ්චිත භූමි ඒකකයක් තුළ ජීවත්වන ජන සංඛ්‍යාව ...................................... නමින් හඳුන්වයි .

26' ලෝකයේ තිරිඟු වගාවේ ව්‍යාප්තිය සඳහා අවශ්‍ය සාධක අතර ...................................... පස වැදගත් තැනක් ගනී

**27 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ප්‍රස්තාරය යොදා ගන්න.**

සංගණන වර්ෂ අනුව ජන සංඛ්‍යාවේ වර්ධනය




**27' 1871** සිට 2012 දක්වා ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය ප්‍රස්තාරයට අනුව .......................................................... වර්ධනයක් සිදුවේ

**28' 2012** වර්ෂයේදී ආසන්න වශයෙන් ..........................................................ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පෙන්වයි.

29';ර්යක් නිම්න හා ආයත ගංගා නිම්න ලක්ෂණ හඳුනාගත හැක්කේ ................................................. ජලවහන රටාව ආශ්‍රිතවය

30' පාරිසරික විසංතුලනය වලක්වා ගනිමින් පරිසර සමතුලිත බව ආරක්ෂා කර ගැනීම සඳහා වර්තමානයේ ශ්‍රී ලංකාව ''''''''''''''''''''''''''''''''''''''''''''''''''''සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත.

**31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

31' පෘථිවියේ සමස්ථ ගොඩබිම් ප්‍රතිශතයෙන් 29%, 9.2%, සහ 6.7% අයත් කර ගන්නා මහාද්වීප අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) උතුරු ඇමරිකාව, අප්‍රිකාව, යුරෝපය (2) අප්‍රිකාව, උතුරු ඇමරිකාව, යුරෝපය
(3) ආසියාව, ඇන්ටාර්ටිකාව, ඕස්ට්‍රේලියාව (4) ආසියාව, ඇන්ටාර්ටිකාව, යුරෝපය (..........)


32' සුළු අපනයන බෝගයක් වන කජු වගාව බහුලව වගා කරන දිස්ත්‍රික්කය වන්නේ,

(1) කළුතර (2) පුත්තලම
(3) මාතර (4) මහනුවර (..........)

33' ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන සාධක දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) සූර්යයා හා ජලය (2) පස හා දේශගුණය
(3) වියෝජකයින් හා ශාක (4) ජෛව සාධක හා අජෛව සාධක (..........)

පහත රූප සටහන උපයෝගී කර ගෙන ප්‍රශ්න අංක 34 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,




**34'** මෙම රූපසටහනේ A-B රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

(1) සුළං කපොල්ලයි (2) ජල කපොල්ලයි (3) දිය බෙත්මයි (4) දූර්ගයයි (..........)

35' මෙම රූපසටහනේ C - D රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) උත්තල බෑවුමකි (2) දළ බෑවුමකි (3) මොහොර බෑවුමකි (4) අවතල බෑවුමකි (..........)

36' මෙම රූපසටහනේ E - F රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) නෙරුවකි (2) නිම්නයකි (3) කොත් කන්දකි (4) උත්තල බෑවුමකි (..........)

37' ශ්‍රී ලංකාවේ කුරුළු පාරාදීසයක් ලෙස ප්‍රචලිත උතුරු පළාතේ පිහිටි අභය භූමිය වන්නේ,

(1) බිබෝව (2) මඩුපාර (3) ආනවිලුන්දාව (4) චුන්ඩිකුලම් (..........)

38' මෙට්‍රික් සිතියම්වල භාවිත භූ ලක්ෂණ අතරින් සැබෑ භූමිය තුළ විද්‍යමාන **<u>නොවන</u>** ලක්ෂණයක් වන්නේ,

(1) වෘක්ෂලතා වර්ග (2) මාර්ග රටා (3) මායිම් වර්ග (4) ජලවහන රටා (..........)

අංක 39 සහ 40 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් ප්‍රකාශ උපයෝගී කර ගන්න

A. දළ ජාතික නිෂ්පාදනය

B. ජන සංඛ්‍යා වර්ධන වේගය

C. ඛණිජ සම්පත් ක්ෂය වීම

D. ඒක පුද්ගල ආදායම

E. ශ්‍රම බලකාය

F. කාර්මික නිෂ්පාදනය

39' එක් සාධකයක වැඩිවීම නිසා එමඟින් තවත් සාධකයක වැඩිවිම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ

(1) A හා B ය (2) A හා C ය (3) A හා D ය (4) A හා F ය (..........)

40' එක් සාධකයක අඩුවීම නිසා අනාගතයේදී අනෙක් සාධකයේද අඩුවීමක් අපේක්ෂා කළ හැක්කේ කවර සාධක යුගලයේද?

(1) A හා F ය (2) B හා E ය (3) C හා F ය (4) D හා E ය (..........)

**MINISTRY OF EDUCATION**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ - ආදර්ශ ප්‍රශ්න පත්‍ර**

**GEOGRAPHY**

**භූගෝල විද්‍යාව**

# QUESTION PAPER - II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය :

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

## භූගෝල විද්‍යාව - II

## අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

සැළකිය යුතුයි

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටස ව්‍යුහගත රචනා ප්‍රශ්න 07කින් සමන්විත වේ. ඉන් 04කට පිළිතුරු සැපයිය යුතුවේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 40කි.

^අ) ඔබ වෙත සපයා ඇති 1:50000 සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු
සපයන්න.

ප්‍රශ්න අංක i සිට iv දක්වා ඇති ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න

i. අංක 01 න් දක්වා ඇති සේවා ස්ථානය කුමක්ද ?

^පොලිසිය / උප තැපැල් කාර්යාලය / තැපැල් කාර්යාලය )

ලකුණු 01

ii. අංක 02 න් දක්වා ඇති මාර්ග වර්ගය කුමක්ද ?

^ සෙසු මාර්ගය / ජීප් රථ මාර්ගය / ගුරු පාර
) ලකුණු 01

iii. අංක 03 න් දක්වා ඇති වගාව කුමක්ද ?

^ ගෙවතු / හේන් / වී )

ලකුණු 01

iv. අංක 04 න් දක්වා ඇති ත්‍රිකෝණමිතික ස්ථානයේ නිවැරදි උන්නතාංශය විය හැක්කේ,

^ මීටර 400 / මීටර 410 / මීටර 420
) ලකුණු 01

v. A අක්ෂරයෙන් කොටුකර ඇති ජලවහන ලක්ෂණය නම් කරන්න

ලකුණු 01

vi. B අක්ෂරයෙන් කොටුකර ඇති ජලවහන රටාව නම් කරන්න

ලකුණු 01

vii. C අක්ෂරයෙන් කොටුකර ඇති භූ ලක්ෂණය නම් කරන්න

ලකුණු 01

සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (a) හා (b) ලෙස පහත දක්වා ඇත. එම ප්‍රකාශ දෙක කියවා බලා නිවැරදි නම් 'නි' යන්න වටාද වැරදි නම් 'වැ' යන්න වටාද ප්‍රශ්න අංක ඉදිරියේ රවුමක් අඳින්න

viii. (a) D අක්ෂරයෙන් දැක්වෙන භූ ලක්ෂණ කොටස දළ බෑවුමකට නිදර්ශනයකි ( නි / වැ )


^b) මෙම සමස්ථ සිතියම් කොටස ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයට අයත් කොටසකි ( නි / වැ)

ලකුණු 02

ix. මෙම සිතියම් ප්‍රදේශයේ ඉහළම උන්නතාංශය වාර්තාවන සිතියම් කාර්තුව නම් කරන්න

ලකුණු 01

**ආ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) ලකුණු කොට ඇති A, B හා C යන මුහුදු අතරින් 'කැරිබියන් මුහුද' දක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F වලින් දක්වා ඇති 2019 අගෝස්තු මාසයේ ලැව්ගිනිවලට ගොදුරු වූ 'ඇමසන් වනාන්තරය' දක්වෙන අක්ෂරය කුමක් ද?


(iii) ලෝක කිරිපට්ටි පාලනය සඳහා ප්‍රසිද්ධ වූ 'ඩෙන්මාර්කය' H,M හා N යන අක්ෂර අතරින් කවර අක්ෂරයක්වේද ?

(iv) J,K හා M අක්ෂර මගින් දැක්වෙන ගංගා අතරින් 'අමූර් ගංගාව' දක්වෙන අක්ෂරය කුමක් ද?

(v) X, Y හා Z අක්ෂරවලින් දක්වෙන දූපත් අතරින් 'තස්මේනියා දූපත' දක්වෙන අක්ෂරය කුමක් ද?

(ලකුණු 05)

**ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




(i) අංක 1, 2 හා 3 වලින් දක්වා ඇති ස්ථාන අතරින් 'මහ කොළඹ සංචාරක කලාපය' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F වලින් දක්වා ඇති අක්ෂර අතරින් 'බතලගොඩ වී පර්යේෂණායතනය' දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) දැනට අඩුම ජන සංඛ්‍යාවක් වෙසෙන 'මුලතිව් දිස්ත්‍රික්කය' සඳහා A, B හා C යන අක්ෂර අතරින් කුමක් වේද?

(iv) J, K හා L යන අක්ෂර අතරින් 'කිරිඳි ඔය' සඳහා යොදා ඇති අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R යන අක්ෂර අතරින් 'අම්පාර නගරය' දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?


(ලකුණු 05)

<u>11 කොටස</u>

02& යාබදව දක්වා ඇත්තේ පෘථිවි අභ්‍යන්තරය දැක්වෙන හරස්කඩක රූපයකි

i. රූප සටහනට අනුව A හා B අක්ෂර වලින් දක්වා ඇති ස්ථර දෙක අනුපිළිවෙලින් නම් කරන්න

(ල. 2)




ii. A අක්ෂරයෙන් දක්වා ඇති ස්ථරයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න

(ල. 3)

iii. (අ) පෘථිවි ශිලා ගෝලය යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න

(ල. 2)

^ආ) මිනිසාට ශිලා ගෝලයෙන් ඇති ප්‍රයෝජන තුනක් දක්වන්න

(ල. 3)

03)

i. 'දේශගුණය' යන්න අර්ථ දක්වන්න

(ල.2)

ii. ' උෂ්ණත්වය , වර්ෂාපතනය හා අක්ෂාංශ ගත පිහිටීම වැනි සාධක පදනම් කර ගනිමින් ග්‍රීකයන් පෘථිවියේ පුළුල් දේශගුණ කලාප තුනක් හඳුනාගෙන තිබුණි'

එම දේශගුණික කලාප තුන අක්ෂාංශ අනුව නම් කරන්න

(ල.3)

iii. සමකයට ආසන්නව ව්‍යාප්තව ඇති ප්‍රධාන වනාන්තර වර්ගය නම් කර එහි ප්‍රධාන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ල.5)

(04)

මිනිස් ආර්ථික කටයුතු අතර නිෂ්පාදන කර්මාන්ත වලට සුවිශේෂ ස්ථානයක් ලැබී ඇත්තේ එහි ඇති මානව උපයෝගීතාව ඉතා උසස් මට්ටමක ඇති බැවිනි

i. කර්මාන්ත ස්ථානගත වීමට බලපාන භෞතික සාධකයක් හා මානව සාධකයක් නම් කරන්න

(ල.2)

ii. මෝටර් රථ කර්මාන්තයේ ප්‍රමුඛ දකුණු ආසියාතික රටක් ද , නැගෙනහිර ආසියාතික රටක් හා අග්නිදිග ආසියාතික රටක්ද නම් කරන්න

(ල.3)

iii. (අ) ඔබ ඉහතින් නම් කළ රටවල් තුනෙන් එක් රටක මෝටර් රථ කර්මාන්තයේ දියුණුවට බලපා ඇති සාධක තුනක් සඳහන් කරන්න

(ල.3)


(ආ) මෝටර් රථ කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවනතා දෙකක් කෙටියෙන් සඳහන් කරන්න

(ල.2)

(05)

i. යාබද ආසියාතික සිතියම් කොටසේ රබර් වගාව සඳහා ප්‍රසිද්ධ A හා B ලෙස දක්වා ඇති රටවල් අක්ෂර අනුව නම් කරන්න

(ල.2)




ii. රබර් වගාව සාර්ථකව ව්‍යාප්ත වීමට නිවර්තන ආසියාතික රටවල් කිහිපයක භෞතික සාධකවල ඇති විශේෂත්වය සම්බන්ධයෙන් ප්‍රධාන කරුණු තුනක් දක්වන්න

(ල.3)

iii ශ්‍රී ලංකාවේ වතු භෝග කෘෂිකර්මාන්තයේ භූමි පරිභෝගය ආශ්‍රිතව ඇති ගැටළු දෙකක් නිදර්ශන සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ල.5)

06) i. ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව අප්‍රිකා සහ යුරෝපා මහාද්වීපය අයත් කරගෙන සිටින ජන සංඛ්‍යා

ප්‍රතිශත වරහන් තුළින් තෝරා මහාද්වීප අනුව ලියන්න ( 8% /10% /16% )

(ල.2)

ii. ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තියේ

a) ආසියාවේ අධි ජන සංකේන්ද්‍රණයක්ද

b) දකුණු ආසියාවේ ද්විතියික ජන සංකේන්ද්‍රණයක්ද

c) අප්‍රිකාවේ ජන හීන ප්‍රදේශයක්ද නම් කරන්න

(ල.3)

iii. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි අසමතුලිතතාවයට හේතු වූ භෞතික සාධකයක් හා මානුෂ සාධකයක්

කෙටියෙන් විස්තර කරන්න

(ල.5)

07) i. පාරිසරික අනවබෝධය නිසා ඇතැම් විට මානවයා නොදැනුවත්ව උපද්‍රවයන් නිර්මාණය කරගෙන ඇත.

ඔබ පරිසරය තුළ හඳුනාගත් එවැනි උපද්‍රවයක් නම් කර එයින් සිදුවිය හැකි ආපදාවක් සඳහන් කරන්න

(ල.2)

ii. 'ලැව්ගිනි ආපදාවක්' ඇතිවීමට බලපාන ස්වාභාවික හේතු **දෙකක් ද** මානුෂ හේතු **එකක් ද** නම් කරන්න

(ල.3)

iii. අ) ලැව්ගිනි නිසා සිදුවන වෘක්ෂලතා වැස්මේ විනාශයෙන් සිදුවිය හැකි පාරිසරික හානි තුනක් සඳහන් කරන්න

ආ) ඔබ ඉහතින් සඳහන් කළ එක් හානියක් පරිසර පැවැත්මට බලපාන ආකාරය විස්තර කරන්න

(ල.5)

08) i 'දේශගුණික වෙනස්වීම්' යන්න අර්ථ දක්වන්න

(ල.2)

ii දේශගුණික වෙනස්වීම් නිසා මානුෂ කටයුතුවලට ඇතිවන බලපෑම් තුනක් සඳහන් කරන්න

(ල.3)

iii දේශගුණික වෙනස්කම් අවම කිරීමට ශ්‍රී ලංකාව දායක වී ඇති ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න

(ල.5)

MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Model Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - ආදර්ශ ප්‍රශ්න පත්‍ර

GEOGRAPHY

භූගෝල විද්‍යාව

# MARKING SCHEME - I,II

# පිළිතුරු පත්‍රය - I,II



අනුග්‍රහය :

# භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

(1) කාබන්ඩයොක්සයිඩ්
(2) බැසොල්ට්
(3) කඳු වැටිය
(4) 50%
(5) ඉඟිනියාගල
(6) භූමි කම්පාවක්
(7) ආසියාතික
(8) 1994 නොවැම්බර් 16
(9) ස්ඵෝටනයක්
(10) භූගත ජලය
(11) වැ
(12) නි
(13) වැ
(14) වැ
(15) නි
(16) 3 - CBD
(17) 4 - DCA
(18) 1 - BCD
(19) 2 - ACD
(20) 4 - CDA
(21) පැසිපික්
(22) ඉන්දියන් සාගරය
(23) 92
(24) මකර නිවර්තනය
(25) ජනසනත්වය
(26) චර්නෝසම්
(27) අඛණ්ඩ
(28) මිලියන 20 2
(29) ජාලාකාර
(30) තිරසර
(31) 4
(32) 2
(33) 4
(34) 1
(35) 3
(36) 2
(37) 4
(38) 1
(39) 3
(40) 2

# II පත්‍රය

## I - කොටස

1) (අ) මෙට්‍රික් සිතියම

(i) උප තැපැල් කාර්යාලය

(ii) සෙසු මාර්ග

(iii) වී වගාව

(iv) මීටර 410

(v) හැඩපලු ගංගා

(vi) අරිය ජලවහන රටාව

(vii) පාෂාණ උද්ගතය

(viii) a නි

b වැ

(ix) ගිනිකොණ දිග කාර්තුව

(ආ) ලෝක සිතියම

(i) C - කැරිබියන් මුහුද

(ii) D - ඇමර්සන් වනාන්තරය

(iii) M - ඩෙන්මාර්කය

(iv) L - අමූර් ගංගාව

(v) Y - තස්මේනියාව

(ඉ) ශ්‍රී ලංකා සිතියම

(i) 2 - මහ කොළඹ සංචාරක කලාපය

(ii) D - බතලගොඩ වී පර්යේෂණායතනය

(iii) B - මුලතිව් දිස්ත්‍රික්කය

(iv) K - කිරිඳි ඔය

(v) R - අම්පාර නගරය

## II කොටස

(2) (i) a. පෘථිවි කබොල (earth Crust)

b. ඉහළ ප්‍රාවරණය ( Upper mantle)

(ii)
- ශිලාගෝලයට අයත් ය. එය පෘථිවි ස්කන්ධයෙන් 1%ක් පමණ වේ.
- ඝනකම ඒකාකාරී නොවේ. සාගරවල දී 5kmක් පමණ ද මහාද්වීපවල දී 60km පමණ ද ගැඹුරට විහිදෙන ඝනකමකින් යුක්ත ය.
- පාෂාණවලින් සමන්විත ය. ප්‍රයෝජනවත් ඛනිජ වර්ග රාශියක් අන්තර්ගත වේ.
- පෘථිවි කබොලේ ඉහළ ම තුනී ස්තරය පස වන අතර එය ජෛව පරිසරය මගින් නිරතුරු ව වර්ධනය වේ. කෘෂිකාර්මික කටයුතුවල දී වැදගත් වන්නේ මෙම තුනී පාංශු ස්තරය යි.
- පාෂාණවල ඝනත්වය, (density of rocks) සංයුතිය සහ පිහිටීම අනුව කබොල කොටස් දෙකකට බෙදේ. ▪ මහාද්වීපික කබොල ▪ සාගරික කබොල
- මහාද්වීපික කබොල ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විත ය. ඒවා මූලික වශයෙන් ම සිලිකා (Si) සහ ඇලුමිනියම්වලින් (Al) යුක්ත බැවින් සියල් (Sial) ස්තරය ලෙස ද හැඳින්වේ.
- සාගරික කබොල බැසෝල්ට් පාෂාණවලින් සමන්විත ය. ඒවා මූලික වශයෙන් ම සිලිකා (Si) සහ මැග්නීසියම්වලින් (Mag) යුක්ත බැවින් සිමැග් (Simag) ස්තරය ලෙස ද හැඳින්වේ.
- සියල් ස්තරය දරා සිටින මූලික පාෂාණ ස්තරය, සිමැග් ස්තරය යි.
- පෘථිවි කබොල, ප්‍රාවරණයෙන් වෙන්වන සීමාව මොහොරෝවිසික් අසන්තතිය (Mohorovicic discontinuity) නමින් හැඳින්වේ.

(iii) අ) පෘථිවි කබොල සහ ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ශිලා ගෝලය ලෙස හැඳින්වේ

ආ) 1) ජීවීන්ගේ වාස භූමිය වීම

2) මානව ක්‍රියාකාරකම් සිදු කිරීම

3) ජීවී අජීවී සම්පත් ප්‍රයෝජනයට ගැනීම

(3) (i) දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය දේශගුණය නම් වේ

(ii) 1) කර්කටක නිවර්තනයත් (උතුරු අක්ෂාංශ 23 $1/2^0$) මකර නිවර්තනයත් (දකුණු අක්ෂාංශ23 $1/2^0$) අතර කලාපය නිවර්තන කලාපය ලෙස හැඳින්වේ

2) කර්කටක නිවර්තනයේ (උතුරු අක්ෂාංශ 23 $1/2^0$) සිට ආක්ටික් වෘත්තය (උතුරු අක්ෂාංශ 66 $1/2^0$) දක්වා කලාපයත් මකර නිවර්තනයේ (දකුණු අක්ෂාංශ 23 $1/2^0$) සිට ඇන්ටාක්ටික් වෘත්තය (දකුණු අක්ෂාංශ 66 $1/2^0$) දක්වා කලාපයත් සෞම්‍ය කලාපය වේ

3) ආක්ටික් වෘත්තයේ (උතුරු අක්ෂාංශ 66 $1/2^0$ ) සිට උත්තරධ්‍රැවය දක්වාත් ඇන්ටාක්ටික් වෘත්තයේ (දකුණු අක්ෂාංශ 66 $1/2^0$) සිට දක්ෂිණධ්‍රැවය දක්වාත් විහිදෙන ධ්‍රැවාසන්න ප්‍රදේශවල ශීත දේශගුණය දක්නට ලැබේ

(iii) නිවර්තන වර්ෂා වනාන්තර

- ජෛව විවිධත්වය ඉහළ මට්ටමක පවතී.
- පැළෑටි වර්ධනය වේගයෙන් සිදු වේ.
- වනාන්තර ස්තර කිහිපයකි.
- ගස්වල පත්‍ර බහුල වීම හා පත්‍ර පළල් වීම විශේෂ ලක්ෂණයකි.
- වැල් වර්ග මෙන් ම යටි රෝපණ ඇත. අපි ශාක බහුල ය.
- මැහෝගනී, කළුවර, උණ, හඳුන්, ඇකේෂියා, තාල වර්ගයේ ගස් වර්ග, යුකැලිප්ටස්වැනි ශාක ද ඇත.

(4) (i) <u>භෞතික සාධක</u>

1) බලශක්තිය - ගල් අඟුරු, ඛනිජ තෙල්

2) ප්‍රවාහනය - ජලය, ගුවන, ගොඩබිම

<u>මානව සාධක</u>

1) තාක්ෂණය

2) යටිතල පහසුකම්

3) ශ්‍රමය ආදි කරුණු

(ii) දකුණු ආසියාව - ඉන්දියාව

නැගෙනහිර ආසියාව - ජපානය/ චිනය/ දකුණු කොරියාව

අග්නිදිග ආසියාව - තායිලන්තය/ මැලේසියාව/

(iii) අ) <u>ජපානය/දකුණු කොරියාව</u>

- නව තාක්ෂණය භාවිතය / රොබෝ තාක්ෂණය
- ගුණාත්මක භාවය/ නව උපාංග එක්කිරීම
- නව නිර්මාණ බිහි කිරිම

<u>ඉන්දියාව/චිනය</u>

- අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව
- වෙළෙඳ පොළ
- ලාභ ශ්‍රමය

ආ) • ශීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් වීම.

- නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම සහිත යාන්ත්‍රික ශ්‍රමය උපරිම ලෙස යොදා ගැනීම. (රොබෝට් තාක්ෂණය)
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීම. (තායිවානය, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව වැනි රටවල)
- විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම.
- නිෂ්පාදන අයිතිය බොහෝ විට බහුජාතික සමාගම් (Multinational Corporations)සතුව පැවතීම.
- විවිධ රටවල් ඒකාබද්ධ ව නිෂ්පාදන එළිදැක්වීම (උදා: ඇමරිකා එක්සත් ජනපදයේ ජෙනරල් මෝටර්ස් සමාගම චීනයේ ෂැන්හයි සමාගම සමඟ)

- අධි සුඛෝපභෝගී රථවාහන (Ultra-luxury vehicles) නිෂ්පාදනය කිරීම.
- ප්‍රවාහනය කරන ද්‍රව්‍ය අනුව සුවිශේෂී නිෂ්පාදන නිර්මාණය කිරීම. (උදාඃ ඉන්ධන, කිරි, ගෑස්, ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බවුසර් එකිනෙකට වෙනස් ය).
- ගොඩ, මඩ, දිය, පොළොවේ ධාවනය කළ හැකි නිෂ්පාදන (වායු පායානය - Hovercraft) එළිදැක්වීම.
- ධාවනය කරන අතරතුර දී ම මෝටර් රථය සැහැල්ලු ගුවන් යානාවක් බවට ස්වරූපය වෙනස් කොට ගුවනින් යා හැකි රථ මෙන් ම ජලයේ කිමිදී යා හැකි මෝටර් රථ ද නිෂ්පාදනය කිරීම.
- ලාභදායී ශ්‍රමය, අමුද්‍රව්‍ය ගෙන්වා ගැනීමේ පහසුව, විදේශීය වෙළෙඳපොළ වැනි සාධක මත ජපානය, ඉන්දියාව, දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව වැනි රටවල මෝටර් රථ කර්මාන්තය ශීඝ්‍රයෙන් දියුණු වීම.
- අතීතයේ මෝටර් රථ නිෂ්පාදනය නොකළ ඇතැම් රටවල් මෝටර් රථ නිෂ්පාදනයට දයක වෙමින් සිටීම. (ශ්‍රී ලංකාව)
- මෝටර් රථ තුළ සුවිශේෂී විද්‍යුත් උපාංග හා උපකරණ (sensor) මගින් උපරිම ආරක්ෂාව හා විවිධ සේවාවන් ලබා දී තිබීම. (උදාඃ GPS තාක්ෂණය, රූපවාහිනී, ගුවන්විදුලි යන්ත්‍ර, වායු සමීකරණ, ශීතකරණ, නම්‍යශීලී ආසන, ස්වයංක්‍රීය දොරවල් හා අගුළු, පැති කණ්ණාඩි, ආබාධිතයන්ට ගැළපෙන හැසිරවීම්, ස්වයංක්‍රීය ව පාලනය වන ප්‍රධාන ලාම්පු, ස්වයංක්‍රීය පණගැන්වීම්, ආරක්ෂිත පද්ධති යනාදිය)
- පරිසර දූෂණය අවම වන පරිදි පරිසර හිතකාමී මෝටර් රථ නිෂ්පාදනය කිරීම.
- මෝටර් රථ කර්මාන්තය දියුණු රටවල් විසින් වෙනත් රටවල නිෂ්පාදන කර්මාන්තශාලා ආරම්භ කිරීම.
- 2020න් පසු ජපානය සැහැල්ලු වාහන, දෙමුහුන් (Hybrid) (ද්‍රව ඉන්ධන, විදුලිය) වාහන වැඩි වශයෙන් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබීම.
- ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරීම සඳහා වැඩි වශයෙන් ප්‍රමාණයෙන් කුඩා වාහන නිපදවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබීම.

(5) (i) A. මැලේසියාව

B. තායිලන්තය

(ii)

- සෙල්සියස් අංශක 27 ක මධ්‍ය උෂ්ණත්වය
- මිලිමීටර 2000ක පමණ වාර්ෂික වර්ෂාපතනය
- තෙතමනය හොඳින් රඳා පවතින ලැටරයිට් හෝ කබොක් මිශ්‍ර රතුපස තිබීම

(iii)

- ඉඩම් කට්ටි කර විකිණීම
- එකම බිමක දීර්ඝ කාලයක් වගා කිරීම නිසා ඵලදාව අඩුවීම
- වතු පැරණිවීම නිසා අස්වැන්න අඩුවවීම
- ඉඩම් භුක්තිය ආශ්‍රිත ගැටළු නිසා ණය සහනාධාර ලබා ගැනීමට ඇති අපහසුව ආදි කරුණු විස්තර කිරීම

6) (i) අප්‍රිකාව - 16%

යුරෝපය - 10%

(ii) a. දකුණු හා අග්නිදිග ආසියාව

b. දකුණු ඇමරිකාවේ නැගෙනහිර වෙරළබඩ කලාපය (බ්‍රසිලයේ රියෝ ද ජැනයිරෝ නගරය ආශ්‍රිත

c. අප්‍රිකාවේ සහරා කාන්තාරය

(iii) 1 <u>භෞතික සාධක</u>

භූ විෂමතාව (කඳු ආශ්‍රිත)

වනාන්තර පිහිටීම

දේශගුණය

2 <u>මානව සාධක</u>

යටිතල පහසුකම් වර්ධනය

රැකියා අවස්ථා ඇතිවීම ආදි කරුණු පිළිබඳ විස්කර කිරීම

(7) (i)

| <u>උපද්‍රවයන්</u> | <u>ආපදාව</u> |
|---|---|
| • වෙරළමායිමේ නිවසක් තනා ගැනීම | සුනාමි |
| • ගංගාපිටාර තැන්නේ සිදු කෙරෙන මානව කටයුතු | ජල ගැලීම් |
| • පහත්බිම්වල සිදු කෙරෙන වගාවන් | ජල ගැලීම් |
| • බෑවුම් ඉඩම්වල නිවාස තනා ගැනීම | නායයාම් |
| • ඉදිරි වැසි රහිත කාලයක කෙරෙන හේන් ගොවිතැන | නියඟ |

(ii) <u>ස්වාභාවික හේතු</u>

- දැඩි නියඟය හා වියළි සුළං
- ශාක කඳන් එකට ඇතිල්ලීමෙන් ගිනි ඇතිවීම
- අකුණු සැර වැදීම
- ගිනි කඳු පිපිරීම

<u>මානුෂ හේතු</u>

- නොසැලකිල්ල මත සිදුවන ගිනි ගැනීම්
- ගිනි තැබීම්

(iii) අ ● නිවාස, දේපළ හා මිනිස් ජීවිතවලට හානි සිදු වීම.

● වන ජීවීන් විනාශ වීම.

● වෘක්ෂලතා වැස්මට හානි සිදු වීම.

● වායුගෝලීය දූෂණය.

● පස හා ජල මූලාශ්‍රවලට බලපෑම් සිදු වීම

ආ ඉහත කරුණු වලින් එකක් විස්තර කරන්න

(8) (i) ක්‍රමික ව චක්‍රීය ව සිදු වූ පාරිසරික ක්‍රියාකාරකම් ක්ෂණික ව සිදු වීම නිසා වායුගෝලීය සංයුතියෙහි සිදු වන වෙනස්කම් මත ගෝලීය උෂ්ණත්වය වැඩි වී දේශගුණයෙහි අන්තගාමී තත්ත්වයන් ඇති වී තිබේ. එහි ප්‍රතිඵල වශයෙන් සුළං රටා, නියං, සුළි කුණාටු, වැසි ලැබෙන කාලසීමාව හා වර්ෂාවේ තීව්‍රතාව, පරිසර උෂ්ණත්වය යනාදියෙහි ඇති වී තිබෙන වෙනස්වීම් දේශගුණික වෙනස්වීම් ලෙස හඳුනා ගත හැකි ය. මේ අනුව පෘථිවිය මත පවත්නා සාමාන්‍ය දේශගුණික රටාවේ සිදු වන කෙටි කාලීන හෝ දිගු කාලීන වෙනස්වීම් දේශගුණික වෙනස්වීම් ලෙස හැඳින්වේ

(ii) ● මත්ස්‍ය අස්වැන්න අඩු වීම නිසා ධීවරයන්ගේ ආදායම අඩු වීම.

● බිම් ලවණීකරණය වීම නිසා වගා බිම් ප්‍රමාණය අඩු වීම.

● රෝග වාහක කෘමීන්ගේ වර්ධනය නිසා ලෙඩ රෝග බහුල වීම.

● කෘෂිකාර්මික භෝගවල අස්වැන්න අඩු වීම.

● ස්වාභාවික ආපදා වැඩි වීම (සුළි සුළං, නියඟ, අධික වර්ෂාපතනය).

● වර්ෂාපතන රටා වෙනස් වීම නිසා වගා කටයුතුවලට බාධා ඇති වීම.

● පහත් බිම් අඩු වීමෙන් ජනාවාස අහිමි වීම.

● පානීය ජලය දූෂණය වීම.

(iii) ● හරිතාගාර වායු වර්ග පිට කරන බලශක්ති ප්‍රභව අඩුවෙන් පරිහරණය කිරීම.

● පුනර්ජනනීය බලශක්ති (සුළං, සූර්ය ශක්තිය වැනි දෑ) භාවිතය දිරිගැන්වීම.

● භෝග වගාව සඳහා රසායනික පොහොර භාවිතය වෙනුවට ජෛවීය පොහොර යොදා ගැනීම.

● ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම.

● වන වගාව ව්‍යාප්ත කිරීම.

● මිශ්‍ර භෝග, බහු භෝග වගාවන් හඳුන්වා දීම.

● පොදු ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම වැනි පියවර අනුගමනය කළ හැකි ය

ආදි කරුණු පැහැදිලි කිරීම


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440